# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,270 — 1961 ජනවාරි 12 වැනි බ්‍රහස්පතින්ද — 12.1.1961**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ජෙදය-සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**සි. 301 වැනි ආහාර මිළ නියෝගය** — **අතිරේක ආහාර ද්‍රව්‍ය (රතුළූනු)**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

දිවයිනේ නියෝජ්‍ය මිල (ආහාර) පාලක තැන්පත් ජේම්ස් හෙන්රි ලැනරෝල් වන මම 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවියයුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු, පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන්, මේ උප ලේඛනයේ 2 වැනි 3 වැනි හා 4 වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව

මෙම නියෝගයෙන් නියම කරමි.

(2) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උප ලේඛනයේ සඳහන් රතුළූනු පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

මෙම නියෝගයෙන් නියම කරමි.

(3) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම රතුළූනු ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා රතුළූනු සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, රතුළූනු හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(5) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා " රාත්තල් " හෙවත් " රා. " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් රතුළූනු තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ද මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර එනම්—

(අ) විකුණූ දිනය ;

(ආ) රතුළූනු විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

13—ජේ. එන්. ආර් 15120—4,500 (1/61)

(ඇ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) රතුළුනු විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත්, උපලේඛනයේ 2 වැනි, 3 වැනි, 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1961 ජනවාරි 12 දින පෙරවරු 11 ට කොළඹ දී අත්සන් තබන ලදී.

ජේ. එච්. ලැනරෝල්,
දිවයිනේ නියෝජ්‍ය මිළ (ආහාර) පාලක තැන.

## උප ලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | පිටරටින් බඩු ගෙන්වන්නෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| රතුළුනු ... ... | 24 0 ... | 25 0 ... | 28 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා රතුළුනු විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් රතුළුනු විකිණිය නොහැකිය.

1—499

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.